# පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

**(මහජන බැංකුවට අනුබද්ධිතය)**

**ෆිච් රේටිංස් ලංකා වෙතින් AA-(lka) වර්ගීකරණය, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් වෙතින් B+/B ජාත්‍යන්තර වර්ගීකරණය සහ ෆිච් රේටිංස් ඉන්ටර්නැෂනල් වෙතින් B ජාත්‍යන්තර වර්ගීකරණය දිනා ඇත.**

## 2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

**පහත දැක්වෙන ස්වාධීන විගණන වාර්තාව පරිවර්තනය කරන ලද්දේ අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීවරුන් විසින් විගණනය කර 2018 මැයි 17 වන දින අත්සන් කරන ලද පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සී සමාගමේ වාර්ෂික වාර්තාවෙහි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළකරන ලද ස්වාධීන විගණන වාර්තාව අනුසාරයෙනි.**

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ පරිවර්තනය

**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමේ කොටස් හිමියන් වෙත,**

**විගණන මතය**

2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (සමාගම) මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ පරිපාලිත සමාගම් (සමූහය) වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය අනුව සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙයි.

**විගණන මතයේ පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs) අනුව අපි විගණනය සිදු කලෙමු. එම ප්‍රමිතීන් වලට අනුකූලව  අපගේ වගකීම මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසෙහි සවිස්තරාත්මකව දක්වා ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම පද්ධතියට අනුකූලව අපගේ වගකීම සපුරා ඇත. විගණනයේදී අප ලබාගත් සාක්ෂි මතය සඳහා පදනමක් සැපයීම ප්‍රමාණවත් බව අප විශ්වාස කරන්නෙමු.

ප්‍රධාන විගණන කරුණු

අපගේ වෘත්තීය නිගමනයට අනුව ප්‍රධාන විගණන කරුණු වන්නේ වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනයේ  වූ අතිශය වැදගත්කමක් ඇති කාරණා වේ. සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන විගණනය දී හා අපගේ මතය ගොඩ නැගීමේදී මෙම වැදගත් කරුණු සැළකිල්ලට ගනු ලැබූ අතර මෙම කරුණු සඳහා අපි වෙනම මතයක් ඉදිරිපත් නොකරමු.
පහත දැක්වෙන කරුණු සඳහා අපගේ විගණනය සිදුකළ ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් දක්වා ඇත.

අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණනයේ වගකීම යන කොටසෙහි දක්වා ඇති වගකීම් අප විසින් සපුරා ඇති අතර එයට මෙම වැදගත්  කරුණු ද ඇතුළත් වේ. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනය සිදු වීමේ අවදානම පිළිබඳ අපගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්විය හැකි ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම අපගේ විගණනයට ඇතුළත් විය. පහත කරුණු ඇගයීම සඳහා ක්‍රියාත්මක කළ ක්‍රියාපටිපාටිය ඇතුළත්ව අපගේ විගණන ක්‍රියා පටිපාටියේ ප්‍රතිඵල මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශන වෙනුවෙන් වන අපගේ විගණන මතයට පදනම සපයයි.

| ප්‍රධාන විගණන කරුණු | |
|---|---|
| ණය හා ලැබීම් වල අලාභ වෙන් කිරීම | ප්‍රධාන විගණන කරුණු සඳහා අපගේ අවධානය යොමු කර ඇති ආකාරය |
| 2018 මාර්තු 31 වන දිනට, ණය හා ලැබීම් වල ශුද්ධ අගය 142,712,576 (රු.000) වන අතර මෙම අගය මුළු වත්කම් වලින් 89% නියෝජනය වේ.<br><br>මෙම මූල්‍ය වත්කම් වලට අදාල වෙන්කිරීම් (තනි හා සාමූහික) කළමනාකරණය විසින් ඇස්තමේන්තු කරන ලද්දකි. මෙම ඇස්තමේන්තු සඳහා සංකීර්ණ ගණනය කිරීම් ඇතුළත් වන අතර ගණනය කිරීම් සඳහා කළමනාකරණය විසින් නෛසර්ගික විනිශ්චය පදනම් කර ගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත සටහන 23.3 මඟින් ඇස්තමේන්තු සහ එහි සංවේදීතාව විස්තර කෙරේ.<br><br>වාර්තාගත කරන ලද ප්‍රතිඵලවල සංවේදීතාව හා නෛසර්ගික විනිශ්චයන් හේතුවෙන් අප විසින් මෙම අලාභ සඳහා වන ඇස්තමේන්තු ප්‍රධාන විගණන කරුණු ලෙස හුවා දක්වන ලදී. | මෙම ණය හා ලැබීම් වලට අදාල ඇස්තමේන්තුගත අලාභ වෙන් කිරීම් වල සාධාරණත්වය ඇගයීම සඳහා අප විසින් පහත විගණන ක්‍රියාපටිපාටි යොදා ගන්නා ලදී.<br><br>- අප විසින් මෙම වෙන් කිරීම් හා ඇතිවිය හැකි අලාභ සිද්ධීන් අගය කිරීම සඳහා යොදාගත් අභ්‍යන්තර පාලන ක්‍රම අගය හා අවබෝධ කර ගන්නා ලදී.<br><br>- අප විසින් මේ සඳහා යොදා ගන්නා ලද ගණනය කිරීම් හා දත්තයන් පරික්ෂා කිරීම සිදු කරන ලදී.<br><br>- මෙයට අමතරව ඉලක්කගත ක්‍රියාපටිපාටි පහත පරිදි අගය කරන ලදී.<br><br>විශේෂ වෙන්කිරීම්<br><br>පරික්ෂා කරන ලද නියැදියකට අනුකූලව කළමනාකරණය විසින් ගනුදෙනුකරුවන්ගේ ඓතිහාසික මුදල් ප්‍රවාහයන්ට පදනම්ව අනාගත මුදල් ප්‍රවාහයන් පරිකල්පනය කොට තිබුණි. තවද ඇපකරයක් හා වෙනත් මූලාශ්‍ර තුළින් ජනනය වන මුදල් ප්‍රවාහයන් මූලාශ්‍රය ලිපි ලේඛන උපයෝගී කරගෙන තහවුරු කර ගන්නා ලදී. |

| | |
|---|---|
| | සාමූහික වෙන්කිරීම්<br><br>කළමනාකරණය විසින් උපයෝගී කරගත් අලාභ අනුපාතයන් අප විසින් ණය හට ගැනීමේ කාලය ඓතිහාසික අලාභ අත්දැකීම් සහ ප්‍රසිද්ධ කරන ලද සාර්ව ආර්ථික දත්තයන් මත පදනම්ව උපකල්පනය කරන ලද ආර්ථික බලපෑම උපයෝගී කරගනිමින් අගය කරන ලදී.<br><br>අප විසින් මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත අදාල හෙළිදරව් කිරීම්වල ප්‍රමාණාත්මකභාවය අගය කරන ලදී.<br><br>(සටහන 23.3 සහ 23.4) |

**2017/18 වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති වෙනත් තොරතුරු**

**මූල්‍ය ප්‍රකාශන හා එයට අප ලබා දුන් විගණන වාර්තාව හැරුණු විට වාර්ෂික වාර්තාවහි ඇති තොරතුරු වෙනත් තොරතුරු ලෙස අන්තර්ගත වී ඇත. වෙනත් තොරතුරු වල වගකීම කළමනාකරණය සතු වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතය වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර අප කිසිදු ආකාරයක සහතික කළ නිගමනයක් ප්‍රකාශ කරන්නේ නැත.**

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනයට අදාළව වෙනත් තොරතුරු පිළිබඳ අපගේ වගකීම වනුයේ වෙනත් තොරතුරු කියවීම සහ එසේ කියවීමේ දී වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග සංඛ්‍යාත්මකව වැරදි ආකාරයට ඉදිරිපත් කර ඇති ද යන්න සලකා බැලීමයි. ඒ අනුව අපගේ කාර්යයන්ට අදාළව වෙනත් තොරතුරු වල සංඛ්‍යාත්මක වෙනස්කමක් පවතින බව තහවුරු කර ගත්තේ නම් එයට අදාල තොරතුරු වාර්තා කිරීම අප විසින් සිදුකළ යුතුය. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට අපට කිසිවක් නොමැත.**

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ සහ ඒ හා සම්බන්ධිත පාර්ශවයන්ගේ වගකීම්**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ශක්තිය11 හා සාධාරණ මතයක් ඉදිරිපත් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් වන අතර එම මූල්‍ය ප්‍රකාශන ප්‍රමානාත්මක සාවද්‍ය ප්‍රකාශන වැරදි හා වංචා වලින් තොර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අත්‍යාවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම සම්පාදනය කිරීම සඳහාද කළමනාකාරිත්වය වගකීමෙන් බැඳෙයි.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සමූහයේ අඛණ්ඩ පැවැත්ම තක්සේරු කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හි ඒ හා සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීමට කළමනාකාරිත්වය වගකීමෙන් බැඳෙන අතර කළමනාකාරීත්වය විසින් ව්‍යාපාර සමූහය ඇවර කිරීමට හෝ ව්‍යාපාර කටයුතු අවසන් කිරීමට හෝ එසේ කිරීමට යථාර්ථවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී හැරුණුකොට මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමෙන් පිළියෙල කිරීම සඳහා ඔවුන් වගකීමෙන් බැඳෙයි.**

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ද කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.

<u>මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම</u>

අපගේ අභිප්‍රාය වන්නේ සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා හෝ ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ වලින් තොර බවට සාධාරණ සහතිකයක් ලබාගැනීම සහ අපගේ විගණන මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීමත් ය. සාධාරණ සහතිකයක් යනු සමස්තයක් වශයෙන් ලබාදෙන සහතිකයක් වන අතර එය සෑම විටම SLAuSs වලට අනුකූලව සිදු කරනු ලබන විගණනයන් ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ ඇති අවස්ථාවල ඒවා අනාවරණය කරගනු ලබන බවට සහතිකයක් නොවේ. වංචා හෝ දූෂණ හේතුකොටගෙන වැරදි ප්‍රකාශන ගොඩනැගිය හැකි අතර ඒවා තනි තනිව හෝ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ගේ ආර්ථික තීරණ වලට බලපෑම් කළ හැකි බව සාධාරණව අපේක්ෂා කළ හැකිනම් ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ ලෙස සලකනු ලබයි.

SLAuSs වලට අනුකූලව විගණනයක කොටසක් ලෙස අප විගනණය පුරාම වෘත්තිය විනිශ්චය සහ වෘත්තීයමය සංශයවාදීත්වය පවත්වා ගනී. තව ද අප විසින් :

- වංචා හෝ දෝෂ නිසා හෝ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ තිබීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීමත් එම අවදානම් වලට ප්‍රතිචාර දැක්විය හැකි විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම හා අපගේ මතයට පදනමක් සැපයීම ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබාගැනීමේ ව්‍යාජ සංහාරය ව්‍යාජත්වය හිතාමතා පැහැර හැරීම ව්‍යාජ නිර්දේශන හෝ අභ්‍යන්තර පාලනය යටපත් කිරීම යන කරුණු හේතු කොට ගෙන වංචා ඇතිවිය හැකි බැවින් වංචා හේතුකොටගෙන ඇති විය හැකි ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ හඳුනාගත නොහැකි වීමේ අවදානම දෝෂ හේතුකොට ගෙන ඇතිවන අවදානමට වඩා වැඩි වේ.

- විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම සඳහා විගණනයට අදාල අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් සමාගමේ හෝ සමූහයේ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිතාවය පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීම සිදුනොවේ.

- ගණකාධිකරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය හා ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය හා කළමනාකරණය විසින් සිදුකරන ලද අනාවරණය කිරීම් වල යෝග්‍යතාවය ඇගයීම.

- කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණ පදනමක් මත පදනම්ව සමාගම හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අතර අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමූහයේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති වන සිදුවීම් හෝ කොන්දේසි සම්බන්ධව ප්‍රධාන අවිනිශ්චිතතාවයක් තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත්විය හැකිද යන්න අප ප්‍රධාන අවිනිශ්චිතතාවය පවතින බව නිගමනය කළහොත් අපගේ විගණන වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන වල ඇති හෙළිදරව් කිරීම් වලට අප අවධානය යොමු කළ යුතු අතර එවන් හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම් අපගේ මතය වෙනස් කිරීමට අපට අවශ්‍ය ය. අපගේ නිගමනයන් අපගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වෙතත් අනාගත සිදුවීම් හෝ කොන්දේසි හේතුකොටගෙන සමූහය අඛණ්ඩ පැවැත්මට බාධා විය හැක.

- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශයේ සමස්ත ඉදිරිපත් කිරීම් ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම් ලබාගත හැකි පරිදි මූල්‍යමය ප්‍රකාශයන් පාදක වන ගනුදෙනු හා සිද්ධීන් නියෝජනය කරන්නේද යන්න ඇගයීම.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම සඳහා සමාගම් සමූහයේ හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම් වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරම් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සමූහ විගණනය මෙහෙයවීම අධීක්ෂණය සහ කාර්ය සාධනය අපගේ වගකීම වේ. අපගේ පරම වගකීම වනුයේ විගණන මතය ප්‍රකාශ කිරීමයි.

අපගේ විගණනය අතරතුරදී අප විසින් හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඕනෑම සැලකිය යුතු අඩු පාඩු ද ඇතුළුව විගණනය සැලසුම් හා නියමිත කාලය පිළිබඳ විගණනය හා නියමිත කාල සීමාව පිළිබඳව සැලසුම් කළ විෂය පථය හා කාල වකවානුව සම්බන්ධයෙන් පාලන කටයුතු සම්බන්ධයෙන් වගකිවයුතු අය සමඟ සන්නිවේදනය කරමු.

ස්වාධීනත්වය පිළිබඳ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව අප සදාචාරාත්මක අවශ්‍යතාවන් අනුගමනය කළ යුතු බවට ප්‍රකාශයක් නිකුත් කිරීමත් අප ස්වාධීනත්වය පිළිබඳ සාධාරණව සිතාගත හැකි සියලු සම්බන්ධතා සහ අනෙකුත් කාරණා සමඟ සන්නිවේදනය කිරීමටත් අප විසින් නිකුත් කරන ලද ප්‍රකාශයක් සමග අප විසින් නිකුත් කරනු ලබන අය ද අපි සපයනු ලැබේ.

වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන් විගණනය කිරීමේදී ප්‍රධාන විගණන කරුණු සම්බන්ධයෙන් අප විසින් වගකිවයුතු අය සමග සන්නිවේදනය කරන ලද කරුණු වලින් අපි තීරණය කරමු. මෙම ප්‍රධාන විගණන කරුණු විගණන වාර්තාව තුළ සඳහන් කරනුයේ නීති රීති හා රෙගුලාසි වලට අනුකූලවය. නීති රීති හා රෙගුලාසි මගින් බාධා පමුණුවන්නේ නම් පොදු යහපත සලකා අනාවරණය නොකරමු.

වෙනත් නීති සහ රෙගුලාසි නියමයන් පිළිබඳ වාර්තා කිරීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තියට අනුකූලව අපගේ විගණනයට අවශ්‍යය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගෙන ඇති අතර, අපගේ විභාගයන්ට අනුව සමාගම් විසින් යෝග්‍ය ගිණුම්කරණ තොරතුරු තබාගෙන ඇත.

මෙම ස්වාධීන විගණන වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු හවුල්කරුවන්ගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය 2965.

වරලත් ගණකාධිකාරිවරු
2018 මැයි 17 දින
කොළඹදී

# ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය

| මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2018** | 2017 | වෙනස | **2018** | 2017 | වෙනස |
| | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| ආදායම | **28,569,534** | 23,859,038 | 19.74 | **33,110,914** | 27,732,754 | 19.39 |
| පොලී ආදායම | **26,704,635** | 22,041,263 | 21.16 | **27,582,045** | 22,784,273 | 21.06 |
| පොලී වියදම | **14,500,158** | 11,829,601 | 22.58 | **14,626,672** | 11,819,756 | 23.75 |
| ශුද්ධ පොලී ආදායම | **12,204,477** | 10,211,662 | 19.52 | **12,955,373** | 10,964,517 | 18.16 |
| වාරික වලින් ශුද්ධ ඉපැයීම | **-** | - | - | **4,053,270** | 3,694,027 | 9.72 |
| ගාස්තු හා කොමිස් ආදායම් | **1,182,573** | 1,133,735 | 4.31 | **685,836** | 621,711 | 10.31 |
| ශුද්ධ විකුණුම් ආදායම් / (වියදම්) | **18,987** | 8,257 | 129.95 | **59,910** | 43,869 | 36.57 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | **663,339** | 675,783 | (1.84) | **729,853** | 588,874 | 23.94 |
| මුළු මෙහෙයුම් ආදායම් | **14,069,376** | 12,029,437 | 16.96 | **18,484,242** | 15,912,998 | 16.16 |
| අඩු කලා : ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණය | **1,592,256** | 215,765 | 637.96 | **1,632,347** | 282,819 | 477.17 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම් | **12,477,120** | 11,813,672 | 5.62 | **16,851,895** | 15,630,179 | 7.82 |
| අඩු කලා : | | | | | | |
| සේවක වියදම් | **2,574,976** | 2,556,242 | 0.73 | **2,992,363** | 2,971,179 | 0.71 |
| දේපළ පිරියත හා උපකරණ | **192,506** | 186,993 | 2.95 | **294,235** | 276,408 | 6.45 |
| ප්‍රතිලාභ හිමිකම් සහ ප්‍රාරක්ෂණ වියදම් | **-** | - | - | **2,776,132** | 2,583,812 | 7.44 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | **2,639,844** | 2,670,768 | (1.16) | **2,746,975** | 2,696,254 | 1.88 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මුළු මෙහෙයුම් වියදම් | **5,407,326** | 5,414,003 | (0.12) | **8,809,705** | 8,527,653 | 3.31 |
| මූල්‍ය සේවා මත එකතු කල අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්දට පෙර මෙහෙයුම් ලාභය | **7,069,794** | 6,399,669 | 10.47 | **8,042,190** | 7,102,526 | 13.23 |
| අඩු කලා : මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද | **1,300,122** | 923,775 | 40.74 | **1,326,916** | 944,418 | 40.50 |
| මූල්‍ය සේවා මත එකතු කල අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්දට පසු මෙහෙයුම් ලාභය | **5,769,672** | 5,475,894 | 5.36 | **6,715,274** | 6,158,108 | 9.05 |
| ආශ්‍රිතයින් හි අලාභ කොටස (බදු පසු) | **-** | - | - | **(52,942)** | (73,875) | 28.34 |
| බදු පෙර මෙහෙයුම් ලාභය | **5,769,672** | 5,475,894 | 5.36 | **6,662,332** | 6,084,233 | 9.50 |
| අඩු කලා : ආදායම් බදු වියදම් | **1,460,342** | 1,466,640 | (0.43) | **1,644,619** | 1,642,617 | 0.12 |
| වර්ෂය සඳහා ලාභය | **4,309,330** | 4,009,254 | 7.48 | **5,017,713** | 4,441,616 | 12.97 |
| ලාභය බෙදී යන ආකාරය | | | | | | |
| සමාගමේ කොටස් හිමිකරුවන්ට | **4,309,330** | 4,009,254 | 7.48 | **4,816,920** | 4,255,132 | 13.20 |
| පාලනයට යටත් නොවන හිමිකම් | **-** | - | - | **200,793** | 186,484 | 7.67 |
| වර්ෂය සඳහා ලාභය | **4,309,330** | 4,009,254 | 7.48 | **5,017,713** | 4,441,616 | 12.97 |
| සාමාන්‍ය කොටසක ඉපැයීම (රු.) | | | | **3.05** | 2.69 | 13.38 |
| සාමාන්‍ය කොටසක ලාභාංශය (රු.) | **1.25** | 1.25 | - | | | |

## තෝරාගත් කාර්යසාධන දර්ශකයන්

| | සමාගම | |
|---|---|---|
| | **31.03.2018 දිනට** | **31.03.2017 දිනට** |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය** | | |
| **මූලික ප්‍රාග්ධනය - (රු. දහස්)** | **26,515,109** | 24,231,162 |
| **මුළු ප්‍රාග්ධන පදනම - (රු. දහස්)** | **23,733,489** | 22,581,118 |
| **මූලික ප්‍රාග්ධනය අවධානම මත බරතැබූ වත්කම් වල ප්‍රතිශතයක් ලෙස (අවමය 5%)** | **18.38** | 17.56 |
| **මුළු ප්‍රාග්ධනය අවධානම මත බරතැබූ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (අවමය 10%)** | **16.46** | 16.37 |
| **ප්‍රාග්ධන අරමුදල් අනුපාතය මුළු තැන්පතු වගකීම් වල ප්‍රතිශතයක් ලෙස (%)** | **38.45** | 54.87 |
| **වත්කම්වල ගුණාත්මකභාවය** | | |
| **දළ අක්‍රිය ණය පහසුකම් - (රු. දහස්)** | **4,562,557** | 1,883,616 |
| **දළ අක්‍රිය ණය පහසුකම් අනුපාතය (%)** | **3.16** | 1.39 |
| **ශුද්ධ අක්‍රිය ණය පහසුකම් අනුපාතය (%)** | **1.85** | 0.91 |
| **ලාභදායිත්වය (%)** | | |
| **පොලී ආන්තිකය** | **8.36** | 7.89 |

| | | |
|---|---|---|
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (බදු වලට පෙර) | **3.70** | 3.99 |
| සාමාන්‍ය හිමිකම් මත ලාභ | **16.66** | 16.89 |
| | | |
| **ද්‍රවශීලතාවය (රු. දහස්)** | | |
| | | |
| අවශ්‍ය අවම ද්‍රවශීල වත්කම් | **9,859,415** | 7,780,950 |
| පවත්නා ද්‍රවශීල වත්කම් | **11,736,167** | 8,418,503 |
| අවශ්‍ය අවම රජයේ සුරැකුම්පත් | **4,939,014** | 3,856,800 |
| පවත්නා රජයේ සුරැකුම්පත් | **4,962,280** | 5,392,651 |
| | | |
| **නාමමාත්‍රික තොරතුරු** | | |
| | | |
| සේවක සංඛ්‍යාව | **2,085** | 2,085 |
| ශාඛා සංඛ්‍යාව | **103** | 103 |
| සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව | **101** | 101 |
| උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව | **-** | - |

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහ | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2018** | 2017 | වෙනස | **2018** | 2017 | වෙනස |
| | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| වර්ෂය සඳහා ලාභය | **4,309,330** | 4,009,254 | 7.48 | **5,017,713** | 4,441,616 | 12.97 |
| **අනෙකුත් විස්තීරණ ආදායම් / (වියදම්)** | | | | | | |
| *ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභවලට නැවත වර්ග කල හැකි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම්* | | | | | | |
| මුදල් ප්‍රවාහ සීමා | | | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය ආයෝජන ලාභ/ (අලාභ) | **(879)** | 879 | (200.00) | **(879)** | 879 | (200.00) |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් | **-** | - | - | **2,828** | - | 100.00 |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් නැවත ගණනය කල ලාභ/ (අලාභ) | **15,860** | (93,771) | 116.91 | **25,507** | (89,497) | 128.50 |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභවලට නැවත වර්ග කල හැකි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම් | **14,981** | (92,892) | 116.13 | **27,456** | (88,618) | 130.98 |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභවලට නැවත වර්ග කල නොහැකි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම් : | | | | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයු ගණන ලාභ සහ අලාභ | **(23,554)** | (22,380) | (5.25) | **(24,936)** | (25,157) | 0.88 |
| ඉහත දෑ සඳහා විලම්භිත බදු වල බලපෑම | **6,599** | 6,270 | 5.25 | **6,623** | 6,493 | 2.00 |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභවලට නැවත වර්ග කල නොහැකි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම් : | **(16,955)** | (16,110) | (5.25) | **(18,313)** | (18,664) | 1.88 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්, බදු ගෙවූ පසු | **(1,974)** | (109,002) | 98.19 | **9,143** | (107,282) | 108.52 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ අදායම | **4,307,356** | 3,900,252 | 10.44 | **5,026,856** | 4,334,334 | 15.98 |
| බෙදී යන අයුරු : | | | | | | |
| සමාගමේ කොටස් හිමියන් | **4,307,356** | 3,900,252 | 10.44 | **5,024,881** | 4,333,892 | 15.94 |
| පාලනය කළ නොහැකි පොළිය | **-** | - | - | **1,975** | 442 | 346.83 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | **4,307,356** | 3,900,252 | 10.44 | **5,026,856** | 4,334,334 | 15.98 |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| මාර්තු 31 වන දිනට | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2017** | 2016 | වෙනස | **2017** | 2016 | වෙනස |
| | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| වත්කම් | | | | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | **4,414,083** | 5,591,170 | (21.05) | **4,766,920** | 6,379,909 | (25.28) |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ඇති ශේෂය | **4,370,473** | 2,089,989 | 109.11 | **8,758,715** | 3,789,047 | 131.16 |
| ගනුදෙනු කිරීම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය ආයෝජන | **174,736** | 201,215 | (13.16) | **315,485** | 529,301 | (40.40) |
| ණය සහ ලැබීම් | **140,962,936** | 134,054,702 | 5.15 | **142,712,576** | 135,469,783 | 5.35 |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබීම් | **-** | - | - | **406,687** | 267,523 | 52.02 |
| මූල්‍ය ආයෝජනය - අලෙවිය සඳහා ඇති | **219,132** | 275,703 | (20.52) | **1,343,454** | 1,094,569 | 22.74 |
| මූල්‍ය ආයෝජනය - පරිණතිය තෙක් රඳවාගෙන ඇති | **4,889,641** | 2,968,042 | 64.74 | **4,889,641** | 2,968,042 | 64.74 |
| වර්තමාන බදු ගෙවීම් | **89,849** | - | 100.00 | **89,849** | - | 100.00 |
| පාලිත සමාගම් වල ඇති ආයෝජනය | **3,213,788** | 2,075,000 | 54.88 | **-** | - | - |
| ආශ්‍රිත සමාගම් වල ඇති ආයෝජනය | **586,427** | 586,427 | - | **423,439** | 476,382 | (11.11) |
| දේපල ආයෝජන | **134,400** | 100,800 | 33.33 | **1,265,996** | - | 100.00 |
| දේපල පිරියත හා උපකරණ | **1,166,883** | 1,254,744 | (7.00) | **4,112,715** | 5,015,558 | (18.00) |
| කීර්ති නාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | **346,395** | 320,183 | 8.19 | **452,883** | 320,411 | 41.34 |
| කල්බදු දේපල | **87,131** | 90,197 | (3.40) | **87,131** | 90,197 | (3.40) |
| විලම්භිත බදු වත්කම් | **-** | - | - | **28,155** | 26,234 | 7.32 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් වත්කම් | **832,219** | 848,591 | (1.93) | **1,299,753** | 936,441 | 38.80 |
| මුළු වත්කම් | **161,488,093** | 150,456,763 | 7.33 | **170,953,399** | 157,363,397 | 8.64 |
| වගකීම් | | | | | | |
| බැංකු සඳහා | **29,423,568** | 35,584,408 | (17.31) | **31,336,173** | 37,085,398 | (15.50) |
| ගණුදෙනුකරුවන් සඳහා | **69,763,219** | 44,722,552 | 55.99 | **69,377,794** | 44,465,568 | 56.03 |
| නිකුත් කළ ආරක්ෂක ණය | **26,281,723** | 38,673,277 | (32.04) | **26,281,723** | 38,569,262 | (31.86) |
| අනෙකුත් මූල්‍ය වගකීම් | **4,645,818** | 2,725,166 | 70.48 | **4,473,552** | 2,563,187 | 74.53 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **-** | 8,363 | (100.00) | **-** | 8,363 | (100.00) |
| රක්ෂණ වගකීම් සහ ප්‍රතිරක්ෂණ ගෙවීම් | **-** | - | - | **4,054,586** | 3,537,110 | 14.63 |
| ප්‍රවර්තන බදු වගකීම් | **-** | 289,978 | (100.00) | **62,673** | 337,291 | (81.42) |
| විලම්භිත බදු වගකීම් | **2,275,868** | 1,923,171 | 18.34 | **2,338,807** | 1,975,528 | 18.39 |
| අනෙකුත් වගකීම් | **2,068,075** | 1,832,555 | 12.85 | **2,173,950** | 1,896,911 | 14.60 |
| මුළු වගකීම් | **134,458,271** | 125,759,470 | 6.92 | **140,099,258** | 130,438,618 | 7.41 |
| හිමිකම් | | | | | | |
| ප්‍රාග්ධනය | **13,236,073** | 13,236,073 | - | **13,236,073** | 13,236,073 | - |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **1,837,413** | 1,621,946 | 13.28 | **1,837,413** | 1,621,946 | 13.28 |
| රඳවාගත් ඉපැයුම් | **11,502,165** | 9,400,084 | 22.36 | **13,167,172** | 10,560,834 | 24.68 |
| අනෙකුත් සංචිත | **454,171** | 439,190 | 3.41 | **448,413** | 420,957 | 6.52 |
| මුළු කොටස්කරුවන්ගේ හිමිකම | **27,029,822** | 24,697,293 | 9.44 | **28,689,071** | 25,839,810 | 11.03 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පාලනය කළ නොහැකි වගකීම | **-** | - | - | **2,165,070** | 1,084,969 | 99.55 |
| මුළු හිමිකම් | **27,029,822** | 24,697,293 | 9.44 | **30,854,141** | 26,924,779 | 14.59 |
| මුළු වගකීම් හා හිමිකම් | **161,488,093** | 150,456,763 | 7.33 | **170,953,399** | 157,363,397 | 8.64 |
| අසම්භාව්‍ය වගකීම හා බැඳීම් | **7,470,875** | 6,439,978 | 16.01 | **7,623,364** | 6,715,524 | 13.52 |
| කොටසක ශුද්ධ වත්කම් අගය (රු.) | **17.11** | 15.63 | 9.46 | **18.16** | 16.36 | 11.03 |

**සහතික කිරීම**

**මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධාන වලට අනුකූලව සකසා ඇති බව අපි විසින් සහතික කරමු.**

| | |
|---|---|
| (අ.ක.ල) | (අ.ක.ල) |
| **සංජීව බණ්ඩාරනායක** | **ඒ.එස්.ඊබ්‍රහිම්** |
| **ප්‍රධාන මූල්‍ය නිලධාරි** | **ප්‍රධාන විධායක නිලධාරි** |

**මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලද්දේ**

| | |
|---|---|
| (අ.ක.ල) | (අ.ක.ල) |
| **හේමසිරි ප්‍රනාන්දු** | **එම්.පී.අමීර්තනායගම්** |
| **සභාපති** | **නියෝජ්‍ය සභාපති** |

**2018 මැයි 17**

**කොළඹ දී ය**